# මැයි .... ඇයි....

**අසෝක සුභසිංහ**



තවත් එක් මැයි දිනයක් පැමිණ ඇත.ලොව වටා දුක් විඳින, වැඩ කරන, ලොව ගොඩ නගන්නට දහඩිය හෙළන මිනිසුන් වෙනුවෙන් බිහිවූ, ලෝකය වැඩ කරන මිනිසුන් අතට පත් කර දෙන්නට බිහිවූ ඒ ශ්‍රේෂ්ඨ මැයි දිනය අබියසට අපි පැමිණ සිටින්නෙමු. 1886 මැයි පළමුවන දා චිකාගෝ නගරයේ දී තම වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් හඬ නැගූ වරදට පාලක පන්තිය විසින් වෙඩි තබා මරා දමන ලද කම්කරුවන්ගේ වීදි පුරා ගලා ගිය ලෙයින් ගොඩ නැගුණ දිනය. ඒ ලෙයෙහි වර්ණයෙන් බිහි වූ රතු ධජයයෙන් අර්ථ ගැන්වුණ උදාර පරමාර්ථ හා අපේක්ෂා ඒ අයුරින් ම මේ මොහොත වන විට ඉටුවී තිබේද? එසේ නොවුණා නම් එයට හේතුව කුමක් ද? මේ ක්‍රියා වලිය ඉතිහාසය පුරා යළි යළිත් සිදුවෙමින් පවතින්නේ ඇයි.? අපි මඳක් විමසා බලමු.

සියල්ලෝම රැළි පවත්වති. පෙළපාලි යති. බෙරිහන් දෙති. සියල්ල ඉතා ආකර්ශණීය ලෙස දිස්වෙයි. එහෙත් සෑම මැයි දිනයකටම පසු මැයි දිනයේ සැබෑ උරුමකරුවන්ට බලපාන වැදගත් යමක් සාකච්ඡා වන්නේද?

ශ්‍රී ලංකාවේදී මැයි දිනය රජයේ නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් වුණ 1956 වසරේ සිට සියළුම වාමාංශික පක්ෂත් ඉතා උත්කර්ෂවත් අන්දමින් මැයි දිනය සමරා ඇත. ඒ දශක ගණනාවක අතීතයේ දී අපේ පැරැන්නන් පවසන පරිදි වාමාංශික පක්ෂ බලවත්ව සිටි අවධියේ ඔවුන් විසින් පවත්වන ලද මැයි පෙළපාලි බලවත් හා දැවැන්ත ජන සහභාගීත්වයක් සහිතව තිබුණි. මේවා ඉතා සාමකාමී හා දැඩි උද්‍යෝගිමත් පෙළපාලි විය.සමහර පෙළපාලි එක් ස්ථානයක් පසුකරන්නට පැය හයක් ගතවූ අවස්ථා අපේ පැරැන්නන්ට මතකය. ඒවා නරඹන්නට පැමිණි ජනකාය ද අති විශාල විය. උද්ඝෝෂණ, සටන් පාඨ වලින් රත් වූ කොළඹ නගරය රණ බිමක් මෙන් ම සැණකෙළි බිමක සිරි ගෙන තිබුණි.

මෙවන් අසිරියක් තිබූ මැයි දිනයේ තේජාන්විත හා උද්යෝගශීලී ගතිය ක්‍රම ක්‍රමයෙන් අතුරුදහන් වූයේ ජේ ආර් ජයවර්ධන ගේ එජාප රාජ්‍ය පාලන සමයේදී ය. ඊට වඩාත්ම බලපෑවේ 1980 ජූලි වැඩ වර්ජනය යි. මේ වැඩ වර්ජනය මුල් කොට ගෙන එජාප රජය වැඩ කරන ජනතාව වෙත දැඩි මර්ධනයක් මුදා හැරියේ ය. වර්ජනයට සහභාගි වූ සේවකයන් දස දහස් ගණනින් රැකියා වලින් ඉවතට දමන ලද අතර වෘත්තීය සමිති නායකයන් හට සෘජුව ම පහර දෙන ලදී. සේවය අහිමි වූ කම්කරුවන්ගේ ජීවිත දෙදරා ගියේ ය. සමහරු දිවි නසා ගත්හ. සමහරු උන්මන්තකයන් බවට පත් වූ හ. මේ තත්වය රට පුරා වෘත්තීය සමිති හා කම්කරු සංවිධාන වලට එකසේ බල පෑවේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස වෘත්තීය සමිති ව්‍යාපාරය ද සී සී කඩ ව ගියේ ය.

එයින් නොනැවතුණ එජාප රජය මැයි රැළිය අහෝසි කොට ඉන්දියාවෙන් ගායක ගායිකාවන් ගෙන්වා මැයි දිනයේ දී ගෝල් ෆේස් පිටියේ දී බයිලා සැණකෙළියක් පැවැත්වී ය. ඒ දේශපාලන රැස්වීම් වලට එන ජනතාව නැවැත්වීමට ය.මැයි දිනය දා සිනමා ශාලා වල ගාස්තු අඩකින් අඩු කොට ජනතාව සිනමා ශාලා වලට කොටු කිරීමට උත්සාහ දැරුවේ ය. මේ සියළු දෙයෙහි අවසාන ප්‍රතිඵලය වූයේ කම්කරු ව්‍යාපාරය බිඳී මැයි දිනය ඇල් මැරුණ දිනයක් වීම ය. වර්ජන පරාජයන්, පාවා දීම්, වෘත්තීය සමිති විසිරී යාමෙන් අඩපන වූ කම්කරු ව්‍යාපාරය යළි එක්තැන් කොට මැයි දිනයේ සටන්කාමීත්වය හා තේජාන්විත භාවය යළි ගොඩ නැගුවේ ජනතා විමුක්ති පෙරමුණය. ඔවුන් විසින් සංවිධානය කරන ලද මැයි රැළි හා පෙළපාලි, වේදිකා නිර්මාණ, මෙතෙක් පැවති මැයි රැළි හා පෙළපාලි වල ව්‍යුහයන් පවා වෙනස් කළේ ය. සාමාකාමී බව හා හික්මීම ප්‍රදර්ශණය කළ එම පෙළපාලි ඉතා ආකර්ශණීය විය.

එහෙත් මේ සියල්ල අසූව දශකයේ අවසාන කාලයේදී කණපිට හැරුණි. මහා ව්‍යසනයකින් පසු දැන් සියල්ල යළිත් සිරිත් පරිදි සිදු වෙමින් තිබෙයි. වෘත්තීය සමිති ව්‍යාපාරය එක් කළ නොහැකි තරමට බෙදී ගොසිනි. සියල්ලෝම රැළි පවත්වති. පෙළපාලි යති. බෙරිහන් දෙති. සියල්ල ඉතා ආකර්ශණීය ලෙස දිස්වෙයි. එහෙත් සෑම මැයි දිනයකටම පසුව ඒ අරභයා පළවෙන ඡායාරූප සැමරුම් හැරෙන්නට මැයි දිනයේ සැබෑ උරුමකරුවන්ට බලපාන වැදගත් යමක් සාකච්ඡා වන්නේද?

සැබැවින්ම ලොව පුරා සිටින කම්කරුවන්ගෙන් මැයි දිනය උදුරා ගෙන ඇත. එය පාලක පන්තියේ අරමුණු හා අපේක්ෂා ජයග්‍රහණය කර ගැනීම වෙනුවෙන් විනා කම්කරු පන්තියේ අවසන් ජයග්‍රහණය වෙනුවෙන් ඉදිරියට යාම වළකා ඇත. කම්කරු පන්තිය තම අරමුණු කරා ගෙන යාමේ, ශක්තිය එක්රැස් කිරීමේ සංවිධානාත්මක ලෝක දිනයක් වෙනුවට මේ මොහොත වන විට මේ වන විට ලංකාවේ දේශපාලන පක්ෂ මැයි දිනය යොදා ගනු ලබන්නේ තම පක්ෂයේ හෝ සංවිධානයේ හෝ බලය ප්‍රදර්ශණය කිරීමේ අරමුණින් ය.

යථාර්ථය එසේ වුව ද කම්කරුවෝ නොකඩවා පෙළපාලි යති. රැළි පවත්වති. මේ වනවිට දිවයිනේ උතුර දකුණ හා නැගෙනහිර සිට මධ්‍යම කඳුකරය දක්වා පැවැත්වෙන සියළුම මැයි රැළි හා පෙළපාලි රක්ත වර්ණයෙන් පිරී ඉතිරී යයි. බෙදී වෙන්වී එකම අරමුණක් වෙනුවෙන් හඬ නගන කම්කරුවන්ගේ හඬින් නගර සභා, කැම්බල්, හයිඩ්පාක්. බීආර්සී පිටි ගිගුම් දෙයි. කොළඹ, යාපනය, තලවාකැලේ මජකළපුව නගර පීඩිත ජනතාවගේ උද්‍යෝගයෙන් ඇළලී යයි. දිවයින පුරා බෙදී විසිරී සිටින, වෙන් වෙන්ව හඬ නගන මෙම පංති බලවේගයන් එක්තැන් කොට දැවැන්ත බලවේගයක් ඇති කිරීමට දැන් කාලය පැමිණ තිබේ. දිවයිනේ නොයෙක් තැන් වල රැස්වන සියළුම නායකයින්, කම්කරුවනි අප වටා රැස් වෙයව් යනුවෙන් කරන ඉල්ලීම අතහැර, විවිධ මතවාදයන් දර්ශණයන් තුළ රැඳී සිටින නමුත් කිසිම කෙනෙකුගේ විශේෂ නායකත්වයකින් තොරව කළ හැකි මහා එක්සත් ව්‍යාපාරයක් ගැන සිතීමට කාලය පැමිණ තිබේ.

එළඹෙන කාලය තුළ රට බෙදා වෙන් කරන අනතුර ලංකාවේ පවතී. රාජ්‍ය ආයතන විවිධ නමින් පුද්ගලීකරණය වෙමින් පවතී. කම්කරු ප්‍රඥප්තිය හමස් පෙට්ටියේ ය. සේවක වෘත්තීය අයිතිවාසිකම් එකින් එක අහෝසි වේගන යයි. ජල සම්පත පවා ජනතාවට අහිමි වෙමින් පවතියි. ක්‍රමානුකූලව මේ සිදුවෙමින් තිබෙන්නේ අපේ රට නව යටත් විජිත යුගයක් කරා දක්කාගෙන යාම ය. කැම්බල් පිටියට, නගර සභා පිටියට, හයිඩ් පිටියට එක් රොක් වී බෙදී වෙන්වී සටන් කරනා ආදරණීය කම්කරු සහෝදර වරුණි, මැයි දිනය ඔබේ දිනයයි. ඔබේ ශක්තිය එක් රැස් කරන දිනයයි. වැඩ කරන ජනතාවගේ දිනයයි. දේශපාලන මුසාවාද වලට නොරැවටී ඒ වෙනුවට වැඩ කරන ජනතාවගේ ශක්තිය එක්තැන් කරන්නට ඔවුන්ගේ අයිතිවාසිකම් හා ජීවන තත්වයන් යහපත් කරන්නට උත්සාහ කළ යුතු දිනයයි. එය නිවැරදිව වටහා ගත් දිනට කම්කරුවන් ජයග්‍රහණය කරනවා ඇත. ■

*තාරකී(Taraki) නම් අන්වර්ථ නාමයෙන් ප්‍රකට ඔහු දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානයේ නිල වෙබ් අඩවිය වන* ***Tamil net*** *හි නිර්මාතෘ වරයා ලෙස මාධ්‍ය දේශපාලනයේ තවත් එක් කැපී පෙනෙන චරිතයක් බවට පත්වී සිටීයේය. ධර්මලිංගම් සිවරාම් නම් වන ඔහු කලක් කොළඹ පුවත්පත් ආයතනයක සේවය කළේය.*

*මේ වන විට ධර්මලිංගම් සිවරාම් මෙලොව හැර ගොස්ය. අප්‍රේල් 28 වනදා රාත්‍රී 10ට පමණ ඉන්ටකූලර් ටර්බෝ වර්ගයේ සුඛෝපභෝගී ජීප් රථයකින් පැමිණි පිරිසක් බම්බලපිටියේ අවන්හලක දී සිවරාම් පැහැරගෙන ගියේය. 29 වනදා අළුයම බත්තරමුල්ල පාර්ලිමේන්තු සංකීර්ණයට නුදුරු දියවන්නා ඔය අසබඩදී ඔහුගේ මළසිරුර සොයා ගැණින. සිවරාම් ඝාතනය කවුරුන් විසින් සිදුකළාදැයි මෙතෙක් අනාවරණය වී නැත. කෙසේ වෙතත් ඔහු තම ජීවිතයේ අවසන් කාලයේ දී ඔහු ලියූ දෑ ආන්දෝලනයට තුඩු දුන්නේය.*

*පසුගිය අප්‍රේල් 13වන දින* ***Daily Mirror*** *පුවත්පතට ඔහු විසින් ලියන ලද* ***The writing is on the wall, and it is in red*** *නමැති ලිපිය විශේෂ අවධානයකට ලක්වීය. මක් නිසාද යත් ජවිපෙ විසින් මෑතක දෙමළ හා මුස්ලිම් ජනතාව අතර ලබාගෙන ඇති ජනප්‍රියතාව පිළිබඳ ඔහු එම ලිපියේ සාකච්ඡා කළේ, ජවිපෙ වෙත ආධාර අනුබල දෙන ඕනෑම අයකුට මරණය හිමි වන බවට කොටි සංවිධානය විසින් තර්ජනය කළ පසුබිමක නිසාය. පහත පළවන්නේ* ***Taraki*** *ලියූ එම ලිපියේ ලංකා පුවත්පතේ පළවූ සම්පූර්ණ පරිවර්තනයයි.*

මඩකලපුව නගරයට පැමිණෙන පිටස්තර පුද්ගලයකුට වැටහෙනු ඇත්තේ සුනාමි විපතින් නිවාස අහිමි වූවන් සඳහා තාවකාලික නිවාස සාදන එකම සංවිධානය ජවිපෙ බවයි. එතරම් ධනවත් නොවන මුස්ලිම් ජනකායක් වෙසෙන කාත්තන්කුඩි ප්‍රදේශයට ආසන්න පාලමුණෛයි හි නිවාස අහිමි වූ පැල්පත් වාසී ජනතාව සඳහා තාවකාලික නිවාස ඉදිකර භාර දීමේ උත්සවය පිළිබඳව ආකර්ෂණීය ජවිපෙ පෝස්ටර් මඩකලපුවේ සෑම නගරයක හා ගමක තාමත් දක්නට ලැබේ. සුනාමි විපතෙන් ආපදාවට පත් ජනතාව සඳහා ජවිපෙ දක්වන කාරුණික උපකාර පිළිබඳව මේ දිනවල අම්පාර දිස්ත්‍රික්කයේ උගත් මුස්ලිම් තරුණයන් දක්වන්නේ ප්‍රසාදයකි. මෙසේ ප්‍රසාදයට පත්වීම පමණක් නොව සමහරු ජවිපෙ දේශපාලන දර්ශනය ද හැදෑරීමට උත්සුක වී සිටිති. අක්කරෙයිපත්තුවේ කැඳ අලෙවිසලක දී හිතවත් මුස්ලිම් තරුණයකු මුණ ගැසෙන තුරු මා හට මෙහි බරපතලකම වැටහුණේ නැත. ජවිපෙ මතවාදය සඳහා රහසින් කටයුතු කරන්නකු ලෙස දැනටමත් කටයුතු කරන ඔහු මා සමඟ කියා සිටියේ, ඉස්ලාමය තමන්ගේම වාසිය සඳහා යොදා ගනිමින් දිළින්දන් අමතක කරන මුස්ලිම් දේශපාලනඥයන්ගේ අවස්ථාවාදය පිළිබඳව ඔහු වැනි බොහෝ තරුණයන් කලකිරීමට පත්ව සිටින බවයි. ත්‍රිකුණාමලය කින්නියා ප්‍රදේශයේ දී ද මේ කතාවම යමකුට වඩා උස් හඬින් අසන්නට ලැබෙනු ඇත. සුනාමිය විසින් නැගෙනහිර මුස්ලිම් සමාජය තුළ රික්තයක් නිර්මාණය කර ඇති බවට සැකයක් නැත. ජවිපෙ මෙම හිස් තැන ඉතා ඉක්මණින් පුරවා දමමින් සිටී. මෙම ප්‍රදේශවල ජවිපෙ සංවිධාන හැකියාව අන් කිසිදු ප්‍රධාන ප්‍රවාහයේ දේශපාලන පක්ෂයක් සමඟ සැසඳිය නොහැක. මන්මුණෛයි ප්‍රාදේශීය